# නිදහස් අධ්‍යාපනය මුලින්ම යෝජනා කළ

# ඒ. රත්නායක

**වර්ෂ 1900 ජනවාරි මස 07 වැනිදා උපත ලද අබේරත්න රත්නායක මහතා වර්ෂ 1977 නොවැම්බර් මස 22 වැනිදා අභාවප්‍රාප්ත විය. මේ ලිපිය ඒ මහතාගේ 121 වැනි ජන්ම දිනය සිහිකිරීම පිණිසය.**

1931 දී පැවැති රාජ්‍ය මන්ත්‍රණ සභාව සඳහා වූ පළමුවන මැතිවරණයේදී අබේරත්න රත්නායක මහතා දුම්බර ආසනයට තරග කළ විට ඔහු සිය ප්‍රතිවාදීන්ට යෝජනා කළේ එකට එක්වී රැස්වීම් තැබීමටය. සෑම රැස්වීමකදීම අපේක්ෂකයෝ සිය ප්‍රතිවාදීන්ට ප්‍රශංසා කරමින් තමන්ට ඡන්දය දෙන ලෙස ඉල්ලා සිටියහ. මුළු ඡන්ද කොට්ඨාසය පුරා කලකෝලාහල තබා නිත රිදෙන අන්දමේ වචන හුවමාරුවක්වත් සිදු නොවීය.

මෙම මහත්මා දේශපාලනඥයා නිදහස් අධ්‍යාපනය උදෙසා පුරෝගාමී සේවාවක් කළේය. මේ බව ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතා සනාථ කළ බව ආචාර්ය කාලෝ ෆොන්සේකා මහතා සිය දේශනවලදී පැහැදිලිව පෙන්වාදී ඇත.

ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතා විසින් ලියන ලද සිය ස්වයං චරිතාපදානයක් වූ 'THE ROAD TO PERADENIYA' නමැති මෙම කෘතියේ සඳහන් වන්නේ නිදහස් අධ්‍යාපනය උදෙසා වූ කමිටුවේ අවසාන රැස්වීමේදී ඒ. රත්නායක මහතා, හෝඩියේ සිට විශ්වවිද්‍යාලය දක්වා නිදහස් අධ්‍යාපනය ලබාදීමට විධිවිධාන තිබේද කියා ප්‍රශ්නයක් මතු කළ බවය.

මෙම අවධියේ මෙරට පාසල් පද්ධති තුනක් විය. සමහර පාසල් රජයෙන් පාලනය විය. සමහරක් ආගමික සංවිධාන මගින් පාලනය විය. අනෙක් සමහර පාසල් පාලනය වූයේ පෞද්ගලික කළමනාකරුවන් මගිනි.

අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ එම වාර්තාව අනුව එලෙස කළමනාකරණය වූ පාසල් සඳහා රජයෙන් දීමනා සැපයුනේ එලෙසමය. බෞද්ධ 19.3%, හින්දු 5.5%, රෝමානු කතෝලික 40.7% ක් සහ ප්‍රොතෙස්තන්තු 34.5% බැගිනි.

ජනගහනයෙන් 4.3% වූ ක්‍රිස්තියානි ජනතාවගේ පාසල්වලට රජයේ ආධාරවලින් 75.2%ක් හිමිවිය. ජනගහනයෙන් 95.7% වූ බෞද්ධ, හින්දු සහ මුස්ලිම් ආගමිකයින්ගේ පාසල් සඳහා රජයෙන් දීමනා වශයෙන් ප්‍රදානය වූයේ 24.8% වැනි සුළු ප්‍රමාණයකි.

ඒ. රත්නායක මහතා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ ආසන රැස්වීමේදී මතුකළ ප්‍රශ්නයට එහි සභාපති පළමුවැනි අධ්‍යාපන ඇමැති ධුරය හෙබවූ ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා පිළිතුරු වශයෙන් පවසා ඇත්තේ එවැනි විධිවිධානයක් නොමැති වුවත් දැනටමත් යම්කිසි නිදහස් අධ්‍යාපන ක්‍රමයක් මෙරට පවතින බවය. එසේම රටේ සෑම ඡන්ද කොට්ඨාසයකම පිහිටුවීමට අපේක්ෂා කර තිබෙන මධ්‍ය විද්‍යාල නිසා එම ක්‍රමය තහවුරු වන බව පවසා ඇති බව ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් "THE ROAD TO PERADNIYA" කෘතියේ සටහන් කර තිබේ.

එහෙත් රත්නායක මහතා දැඩිව පවසා ඇත්තේ, මේ ප්‍රජාතාන්ත්‍රික පොදුජන යුගයේදී පූර්ණ නිදහස් අධ්‍යාපන ක්‍රමයක් රජය ඉදිරිපත් කළ යුතු බවය. ඒ අදහසට කීප දෙනකුම පක්ෂව කතා කළ හෙයින් අවසානයේදී මේ පිළිබඳව ඡන්ද විමසීමක් සිදු කෙරිණි. ඒ අනුව වැඩි ඡන්දයෙන් ඒ. රත්නායක මහතාගේ සංකල්පය සම්මත විය.

මුලදී ආචාර්ය කන්නන්ගර මහතා නිදහස් අධ්‍යාපන සංකල්පයට පක්ෂ නොවුවත් එය සම්මත වූ පසු එය ක්‍රියාත්මක කිරීමට දිවිහිමියෙන් ක්‍රියා කළ බව වාර්තා කළ යුතුව ඇත.

ඒ. රත්නායක මහතා දුම්බර ජනතාව අතුරින් බිහි වූ දුර්ලභ ගණයේ නායකයෙකි. 1931 පටන් 1965 මැතිවරණය දක්වා අවුරුදු 04ක් හැර ඉතිරි මුළු කාලයම එතුමා දුම්බර ජනතාව නියෝජනය කළේය.

සිංහල භාෂාව හොඳින් කතා කරන්නට හා ලියන්නට දත් සිංහල සාහිත්‍ය ගැන මනා අවබෝධයක් ඇති මන්ත්‍රීවරු අද ඕනෑ තරම් වෙති. එහෙත් 1931 පළමුවෙනි රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත්වූ මන්ත්‍රීවරුන් අතුරින් සිංහල සාහිත්‍ය ගැන මනා අවබෝධයක් ඇතිව ඉංග්‍රීසියෙන් හා සිංහලෙන්ද හොඳින් කතා කිරීමට දක්ෂ මන්ත්‍රීවරුන් සිටියේ තිදෙනකු පමණි. එනම් ඩී.බී. ජයතිලක, ඩබ්. ආතර් ද සිල්වා හා ඒ. රත්නායක යන මහත්වරුන්ය. අනෙක් මන්ත්‍රීවරුන් සිංහල නොදැන සිටි බවක් මෙයින් අදහස් නොකෙරේ. එහෙත් ඔවුන්ගේ සිංහල දැනුම ඉංග්‍රීසි දැනුමට වඩා බොහෝ අඩුය.

මැතිවරණ දේශපාලනයෙන් ඉවත්වී ගිය පසු උත්තර මන්ත්‍රී මණ්ඩලයට පත්වී එය විසුරුවා හරින තෙක් එහි සභාපති පදවිය දැරූ මේ නායකයා ගේ දේශපාලන ජීවිතය ගැන අමුතුවෙන් හැඳින්වීමක් අනවශ්‍යය.

එංගලන්තයට ගොස් එහි දී උග්‍ර කොමියුනිස්ට්වාදීන් බවට පත්වන එහෙත් පෙරලා සියරට පැමිණ සුඛෝපභෝගී ජීවිත ගත කරන ධනවත් තරුණයින් ගැන රත්නායක මහතා මෙසේ සඳහන් කර ඇත.

'මේ ගොල්ලෝ අම්මලාට තාත්තලාට සල්லි තියෙන නිසා එංගලන්තයේ යනවා බැරිස්ටර් දෙස්තර විභාගය පාස් කරන්න. එහෙ ගියාම කොමියුනිස්ට්කාරයෝ වෙලා කම්කරුවන්ට සේවය කරන්න ඕන කියා මේ පත්තර ලියුම් එවනවා. ඒ ගොල්ලන්ගේ දේශපාලනය එංගලන්තයේදී බොහොම රතුයි. ලංකාවට ආවට පස්සේ ඒවා ඔක්කෝම අමතක කරලා හොඳට කුරුඳුවත්තට වෙලා ධනපති ජීවිතයක් ගත කරනවා. ඒ මොකද? අර එංගලන්තයේ තිබුණු රතු ඔක්කෝම ඒ ගොල්ලෝ මුහුදට විසි කරනවා. ඒ නිසා තමයි ඔය නැව එන පාරේ රතු මුහුද කියලා එකක් හැදිලා තියෙන්නේ.'

ඉන්දු-ලංකා මිත්‍ර සංගමයේත් මහත්මා ගාන්ධි පදනමේ සභාපති පදවිය දිගටම දැරූ මේ අවිහිංසාවාදී නායකයා කවදාවත් විශේෂයෙන් දුම්බර ජනතාවගේත් සාමාන්‍ය මුළු මහත් ලංකාවාසීන්ගේත් සිත්වලින් බැහැර කළ නොහැකිය.

ඒ. රත්නායක මහතාගේ ගායන හැකියාව ගැන ප්‍රවීණ ලේඛක එස්. පියසේන මහතා 1979 දී පුවත්පතකට ලියූ ලිපියක සඳහන්වේ.

ජේ.ආර්. ජයවර්ධන මහතා කැලණියේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය දරණ කල්හි මල්වතු හිරිපිටියේ ගොයම් කෙළීමේ විශාල උත්සවයක් පැවැත්වුණි. එම උත්සවයට සහභාගි වූ විශේෂ අමුත්තෝ කිහිප දෙනෙක්ද වූහ. ගොයම් කෙළීමෙන් පසු සීපද කීමේ තරගයක් ඇරඹුණේය. පැමිණ සිටි පිරිසේ වූ එක් සම්භාවණීය අමුත්තෙක් කිසිවෙකු බලාපොරොත්තු නොවූ පරිදි එකවරම නැගිට මෙම සිව්පදය කීවේය.

**දුම්බර කෙතේ වැට බැඳලා නෙතට කැළුම්**
**මහවැලි ගඟේ දිය පිරිලා හිතට නැවුම්**
**ගම්බර ලියෝ හිස ඔසවා බලන බැලුම්**
**තුම්පත් රටාවකි දුම්බර කෙතේ නෙළුම්**

මේ පැරණි සීපදය මිහිරි තාලයට ගැයූ අමුත්තා එවකට ආහාර හා සමුපකාර පදවිය දැරූ අබේරත්න රත්නායක මහතාය.

සුගීස්වර සේනාධීර